**දශක තුනක් තිස්සේ උතුරේ පැවැති යුද්ධයේ අවසාන දින කිහිපය තුළදී රජයේ හමුදාවන්ට බාරවූ එල්.ටී.ටී.ඊ. ඉදිරි පෙළ සාමාජිකයන් අතර එම සංවිධානයේ දේශපාලන අංශයේ කාන්තා නායිකාව තමිළිනී ජෙයක්කුමාරන් ද විය. යුද ජයග්‍රහණයෙන් පසුව රජය ක්‍රියාත්මක කළ පුනරුත්ථාපන වැඩ පිළිවෙළ යටතේ නැවත සමාජ ගත කෙරුණු ඇය ඉන් වසර කිහිපයකට පසුව මහරගම පිළිකා රෝහලේදී ජීවිතක්ෂයට පත්වූයේ පිළිකා රෝගියෙකුවය. පිළිකා රෝගයට ගොදුරුව මරණය අභිමුව සිටියදී ඇය එල්.ටී.ටී.ඊ. සංවිධානය හා සම්බන්ධ සිය ක්‍රියාකාරකම් සහ බිහිසුණු අත්දැකීම් පිළිබඳ තබන ලද ලිඛිත සටහන් පසුව දෙමළ භාෂාවෙන් පොතක් ලෙස ප්‍රකාශයට පත් කෙරිණි. එහි ඇතුළත් කරුණු දෙමළ සමාජය තුළ මහත් විවාදයටද, බාහිර සමාජයේ මහත් අවධානයටද ලක්වීය.**

**අතිමහත් සමාජ පිරිවැයක් දරමින් එල්.ටී.ටී.ඊ. යුද සංවිධානය වැනසීමට රජයේ හමුදා සමත් වුවද, එම සංවිධානයේ නැඟීමට සහ පැවැත්මට බලපෑ හේතු නැසීමට රජය මෙතෙක් සමත්වී නැත. උතුරේ දෙමළ ජාතිවාදයද, නැඟෙනහිර මුස්ලිම් ජාතිවාදයද, දකුණේ සිංහල ජාතිවාදයද මේ මොහොතේ නව වටයකින් හිස ඔසවමින් සාමකාමී පුරවැසි සමාජයට සන්නිවේදනය කරන පනිවිඩයද බෙහෙවින් භයානකය. එවැනි පසුබිමක මද අස්වැසිල්ලක් භුක්තිවිඳිමින් සිටින දැනුම්වත් සිංහල පුරවැසි සමාජයට තමිළිනීගේ මරණාසන්න ස්මරණය මගින් ලබාදෙන පනිවිඩයේ ඇති සුවිශේෂීත්වය සළකා එහි සිංහල පරිවර්තනය කොටස් වශයෙන් ඔබ වෙත ගෙනඑන්නෙමු.**

**තමිළිනී දෙමළ බසින් තැබූ සටහන් සිංහලයට නැඟූ ආචාර්ය ස්වාමිනාදන් විමල් සහ ඒ සඳහා අවශ්‍ය සෙසු සම්පත්දායකත්වය සැපයූ සිනමාවේදී ධර්මසිරි බණ්ඩාරනායක දෙපළට මෙහිදී අපගේ විශේෂ ස්තුතිය පිරිනමමු.**

සන්නසට සකස් කරන්නේ - ශ්‍රීලාල් සෙනෙවිරත්න




15

# විදූෂා අක්කාත් සමඟ ගත කළ අවසන් දිනය

කොටි සංවිධානයෙහි දැනුම් දීම පිළිගෙන ජනතාව යාපනය අත්හැර යාම කොටි සංවිධානය තමන් ලද ජයග්‍රහණයක් සේ සැළකුවේය. එක්සත් ජාතීන්ගේ සංවිධානය ඇතුළු බොහෝ ජාත්‍යන්තර සංවිධාන කෙළින්ම ජනතාවට සහනාධාර ලබාදීමට සැළසෙන ජාත්‍යන්තර පිළිගැනීමක් ලැබෙන සිද්ධියක් ලෙසින් මෙය සැළකුණි. කොටි සංවිධානයෙහි නායකත්වයට පිටුපසින් දෙමළ ජනතාව පෙළ ගැසී සිටින බව ඇඟවෙන පුවත ලෝකයට පෙන්වීමේ සිදුවීමක් ලෙස සංවිධානය මෙය ප්‍රචාරය කළේය.

ලංකාවේ හමුදාව යාපනය දිස්ත්‍රික්කය සම්පූර්ණයෙන්ම අත්පත් කරගත්තේය. නමුත් ජන ශූන්‍ය ප්‍රදේශයක් අත්පත් කරගැනීම ඔවුන්ගේ දේශපාලනික පරාජයක් බවත්, ගොඩනැඟිලි පිරුණු, මිනිසුන් නොමැති යාපනය දීර්ඝ දින

**සංවිධානයේ සටන්කාමී සාමාජිකාවන් වූ අපි සිහින දුටුවේ අහස දුන්නක් සේ නමන්නයි. දැන් සියලුම සිහින අහෝසිව ගොස් නියම තත්ත්වයෙහි එළිපත්තට පැමිණ සිටින්නෙමු.**

ගණනාවක් හමුදාවට ආරක්ෂා කර ගැනීමට නොහැකි තත්ත්වයක් තුළ ඔවුනට පසු බැසීමට සිදුවනු ඇතැයි කොටි විශ්වාස කළහ.

යාපනය අහිමිවීමෙන් පසු සංවිධානයෙහි ප්‍රධාන මධ්‍යස්ථානත්, ලිපි ලේඛනත් කිලාලි කලපුව හරහා වන්නියට ගෙන ගියේය. ජනතාවටද වන්නියට යන මෙන් දැනුම් දුන්නේය. ජනයා විශාල සංඛ්‍යාවක් වන්නිය කරා ඇදෙන්නට වූහ. සමහරු තෙන්මාරච්චියෙහිම නතර වූහ. එම අවස්ථාවේ අධික ලෙසින් තරුණ තරුණියෝ සහ විශ්වවිද්‍යාල ශිෂ්‍යයෝ සංවිධානයට බැඳුනාහ.

හමුදාව රහස්‍ය ක්‍රියාන්විතයකින් තෙන්මරච්චියේ කනකම්පුලියඩි හන්දිය අත්පත් කරගත්තේය. එයට පසුව මුළු තෙන්මරච්චි ප්‍රදේශයම හමුදාව විසින් අත්පත් කර ගන්නා ලදි. ගුවන් හමුදාවේ ප්‍රහාරද සැලකිල්ලට නොගෙන විශාල ජනකායක් කිලාලි කලපුව හරහා වන්නියට ඇදෙන්නට වූහ. ඒ වන තෙක් වන්නි ප්‍රදේශය නොදත් ජනයා පවා කුමක්දෝ විශ්වාසයකින් යුතුව වන්නියට යන්නට වූහ. ජනයාගෙන් තවත් කොටසක් නැවතත් තම ගෙවල් දොරවල්වලට යාමේ තීරණය සහිතව තෙන්මාරච්චියෙහි රැඳී උන්නෝය. එම ජනතාව නැවතත් හමුදා පාලන ප්‍රදේශයට යනවාට කොටින් කිසි සේත්ම කැමති වූයේ නැතත් සංවිධානය සිටියේ එය වැළැක්විය නොහැකි තත්ත්වයකය. එහෙත් දිගටම යාපනය දිස්ත්‍රික්කයේ රැඳී සිටින හමුදාවට හිසරදයක් වන අන්දමේ ප්‍රහාර සිදු කිරීමට නම් යාපනයේ හමුදා පාලන ප්‍රදේශය තුළ ජනතාව සිටීම කොටින්ට යහපත්ය යනුවෙන් අදහස් කළේය.

ජන ශූන්‍යව පැවැති චාවකච්චේරි හන්දියෙහි මාත් විදූෂා අක්කාත් ගත කළ අවසන් දිනය කිසිසේත්ම අමතක කළ නොහැකිය. ඒ වනතෙක් වන්නිය සඳහා වන ගමන් මාර්ගය වශයෙන් පැවැති කිලාලි මුහුදු වෙරළ ප්‍රදේශය උත්සවය අවසන් වූ පසුව කෝවිල් වීදිය මෙන් හිස් බවින් පිරී තිබුණි. අවසානයට පැවැති බෝට්ටුවකට නැඟී ඇස්මානයෙන් නොපෙනී යන තෙක් යාපනයෙහි තෙන්මාරච්චි මුහුදුබඩ පෙදෙස දෙස මම නෙත් දල්වාගෙන උන්නෙමි. ඉතාමත් සුන්දර නගරයක් ද, එහි ජනයාගේ ජීවිතය ද යුද්ධය විසින් කුරිරු ලෙසින් විකෘති කර විනාශ කරනු ලැබුවේය යන්න සිතා ගැනීමටවත් නොහැකි තරම් විය. යුද්ධය විසින් ජනතාව කෙසෙල් ගසක මුලින් වැඩෙන කෙසෙල් පැලයක් සේ මුල් පිටින් පස්වලින් උදුරනු ලැබ විසි කර තිබුණි.

'අවුරුදු විස්සක්ම හිටියේ සංවිධානෙ, කොයිතරම් ගැටුම්වලදී තුවාල වෙලා තියනවද ? බලසේනාව මෙහෙයවන එකයි තුවක්කුව උස්සලා වෙඩි තියන එකයි විතරයි මං දන්නේ. ගෙදර ගිහින් මං මොනව කරන්නද?

මං සංවිධානේ යුනිෆෝම් එක පිටින් තුවක්කුවත් අරගෙන ගමට ගිය වෙලාවේ හැමෝම මං දිහා බැලුවෙ ගරුසරුව. මම ඒ අය වෙනුවෙන් සටන් කරන්න ගියාය කියලා. ඒ අය තමන්ගේ දරුවෙකුට වගේ හිතලයි ආශ්‍රය කෙරුවේ. දැන් මම ගමට යන්නේ යුනිෆෝම් එකයි තුවක්කුවයි නැතුව. මට හරිහමන් ඇඳුමක්වත් නෑ. මට කියලා කිසිම දෙයක් හම්බකරගත්තෙත් නෑ. දැන් කට්ටිය මාව දැක්කම වෙන පැත්තක් බලාගන්නවා. එහෙම නැත්නම් ඔලොක්කුවට හිනා වෙනවා. 'මුන්ට පණ පිටින් එන්නේ නැතුව සයනයිඩ් කන්න තිබුණානේ' කියන කතා පවා මට පිටුපස්සෙන් කියනවා මට ඇහිලා තියනවා. දැන් මම අවලංගු කාසියක්.'

'ඕකි ඉස්සර සංවිධානේ හිටියේ. දැන් ආමිකාරයෝ එක්ක වැඩ කටයුතු. එහෙ යන එවුන්ගේ නම හොඳ නෑ.'

මෙම පරිච්චේදය මෙසේ ආරම්භ කළේ ඇයිද යන ප්‍රශ්නය මම මගෙන්ම ඇසුවෙමි. මෙය නොවෙයිද අද දවසේ යථාර්ථය? සංවිධානයේ සටන්කාමී සාමාජිකාවන් වූ අපි සිහින දුටුවේ අහස දුන්නක් සේ නමන්නයි. දැන් සියලුම සිහින අහෝසිව ගොස් නියම තත්ත්වයෙහි එළිපත්තට පැමිණ සිටින්නෙමු.

ආයුධ සන්නද්ධ අරගලයේදී සටන්කාමී සාමාජිකාවන්ගේ දායකත්වයන් සහ කැපකිරීම් අප සමාජයේ සාමාන්‍ය චින්තන ස්වාභාවයෙන් ඔබ්බට ගිය, එසේ නැතහොත් ඒවා උල්ලංඝනය කළ ක්‍රියාකාරකම් විය. විමුක්ති කොටි සංවිධානය තනි සමාජයක් ලෙස තමන්ම පුළුල්ව වර්ධනය කරගෙන නැගී සිටි අතරම ආයුධ දැරූ සටන්කාමී සාමාජිකාවෝද සමාජයෙන් වෙන්වූ මුළුමනින්ම ස්වාධීන සංවිධානයක් ලෙසින් ගොඩනැගී උන්හ. සමාජය සටන්කාමී සාමාජිකයන්ගෙන් වෙන්ව සිටිමින් විශ්වාස කළ නොහැකි විස්මය සමඟින් ප්‍රශංසාව පළ



36 වන පිටට

සුභාවිත ගීතයේ අන්තර්ජාල නවාතැන - තිසර ගුවන්විදුලිය www.thisara.com